# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,560 — 1965 නොවැම්බර් 18 වැනි බ්‍රහස්පතින්ද— 1965.11.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් සංඝාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ප්‍රකාශන ආදිය

අ. ආ. කා. අංක එන්. 110/65

ශ්‍රී ලංකාද්වීපයේ හා තදිය යටත් දේශයන්ගේ අග්‍රාණ්ඩුකාර හා සේනාධිනායක වූ්‍ර්‍ර්‍රීන,
බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ අති උත්තම පටිපාටියෙහි සාමාජිකයකු වූ
විලියම් ගොපල්ලව උතුමාණන් වහන්සේ විසිනි.

මුද්‍රාව

ඩබ්ලිව්. ගොපල්ලව.

මුත්තයියා රාජනායගම් මහතා,
නෙවිල් ලින්කන් අබේවීර මහතා,
වෙල්ලයියා ලෝගනාදන් මහතා,
අලවි ඉබ්‍රාහිම් මාකන් මාකර් මහතා,
කළුදේවගේ සිරිල් මැතිව් මහතා,
මාකස් සන්දදස බක්මීවැව මහතා,
සෝමචන්ද්‍ර සාසනපාල පෙරේරා මහතා

වෙතය.

ශුභාශිංශන පෙරටුවයි :

මෙහි පහත සඳහන් කාර්‍යයන් සඳහා පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම අවශ්‍ය බැව් මට පෙනී යන හෙයින්,

අග්‍රාණ්ඩුකාර නැත්පත්, විලියම් ගොපල්ලව වන මම, ඔබේ විචක්ෂණ භාවය, දක්ෂතාව හා විශ්වාසකම කෙරෙහි බලවත් භක්තියක් හා විශ්වාසයක් තබමින් පරීක්ෂණ කොමිෂන් සභා ආඥා පනතේ (393 කොටස) 2 වන වගන්තියේ ප්‍රතිපාදන අනුව එකී මුත්තයියා රාජනායගම් මහතා, නෙවිල් ලින්කන් අබේවීර මහතා, වෙල්ලයියා ලෝගනාදන් මහතා, අලවි ඉබ්‍රාහිම් මාකන් මාකර් මහතා, කළුදේවගේ සිරිල් මැතිව් මහතා, මාකස් සන්දදස බක්මීවැව මහතා, සෝමචන්ද්‍ර සාසනපාල පෙරේරා මහතා යන ඔබ, පහත සඳහන් කරුණුවලට විශේෂ සැළකිල්ල යොමු කරන අතරම, පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අනුග්‍රහය ලත් නීතිගත සංස්ථාවන්හි සේවා යෝජක-සේවක දෙපක්ෂය අතර ලාභ බෙදා ගැනීමේ ක්‍රමයක් යොදා ගැනීම ගැන කරුණු විභාග කර බලා වාර්තා කිරීම පිණිස මෙයින් පත් කරමි.

(1) එවැනි ලාභ බෙදා ගැනීමේ ක්‍රමයක විෂය කරුණු හා ප්‍රමාණය.

(2) ලාභාංශ වශයෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන් ගණන් බැලීමේදී යොදා ගත යුතු මූල ධර්ම හා පදනම් සහ එකී මුදල් ගෙවීමේ ක්‍රම.

(3) එවැනි ලාභ බෙදා ගැනීමේ ක්‍රමයෙකදී පාඩු විඳින්නට සිදුවූ බව ගැන නැකිමක් නැතිව වර්ෂයක් පාසා අවම මුදල් ප්‍රමාණයක් සේවා යෝජකයා විසින් සේවකයන්ට ගෙවිය යුතුද නැද්ද යන වග සහ ලාභ මට්ටම ගැන නැකිමක් නැතිව, සේවකයන්ට ලාභාංශ වශයෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන්හි ඉහළ මට්ටමක් තිබිය යුතුද යන වග සහ එසේ තිබිය යුතු නම්, එවැනි අවම ප්‍රමාණයක් සහ ඉහළ මට්ටම ගණන් ගත යුත්තේ කුමන පදනමෙක පිහිටාද යන වග සහ ලාභ සහ පාඩු ඉදිරියට ගෙන යා යුත්තේ කුමන ආකාරයටද යන වග සහ එසේ ඉදිරියට ගෙන යා යුත්තේ කුමන කාල සීමාවක් වෙනුවෙන්ද යන වග :

(4) කිසියම් නියමිත ප්‍රමාණයක් ඉක්මවා යන්නාවූද සේවකයන්ට ගෙවිය යුතු වූද, ලාභාංශ ජාතික මුදල් ඉතිරි කිරීමේ සහතික ස්වරූපයෙන් හෝ අංයෝජන භාරයක ඔවුන්ගේ අය පක්ෂයෙහිලා නැත්පත් මුදල් වශයෙන් සැදුම් ලත්, කලක් පමාවී කරන මුදල් ගෙවීමක් වශයෙන් සේවකයන්ට ගෙවිය යුතුද නැද්ද යන්න හෝ එම මුදල් වෙන යම් ආකාරයකින් ගෙවිය යුතුද යන වග,

(5) ලාභාංශ බෙදා ගැනීමේ කාර්‍යයේදී උද්ගත විය හැකි ආරාවුල් සමථයකට පත් කිරීමේ යන්ත්‍රයද ඇතුළත්ව, ලාභ බෙදා ගැනීමේ ක්‍රමයක් සාර්ථක ලෙස ක්‍රියාවට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රය පිහිටුවාලීම පිණිස ගත යුතු පියවර

(6) ඔබ වෙත කරුණු සැළකර සිටිය හැක්කේ යම් යම් විෂයයන් ගැනද එවැනි ඉහත නියමිත විෂයයන් හා සම්බන්ධවූද ඊට ආනුෂංගික වූද කරුණු :—

තවද ඉහත සඳහන් කරුණු ගැන ඔබ කරන පරීක්ෂණවල ප්‍රතිඵලයක් වශයෙන් අවශ්‍ය යයි ඔබ සළකන යම් යම් නිර්දේශ වෙතොත් එම නිර්දේශද කිරීමට මම ඔබ මෙසේ පත් කරමි.

මුත්තයියා රාජනායගම් මහතා වන ඔබ, උක්ත කොමිසන් සභාවේ සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

තවද ඔබට අවශ්‍ය යයි සිතන අන්දමින්. උක්ත කරුණු ගැන සියළුම පරීක්ෂණ හා විමර්ශණ පවත්වා 1966 මැයි මස දහත් වැනි දිනට ප්‍රථමයෙන් ඔබේ පරීක්ෂණ හා නිර්දේශවල ප්‍රතිඵල විදහා දක්වමින් ඔබේ අත්සන් දරණ, වාර්තාවක් මා වෙත එවීමට උක්ත කොමසාරිස්වරුන් වන ඔබට මෙයින් අවයර දී බලය පවරමි.

තවද ඔබේ අභිමතය පරිදි මහජනයාහට දන ගන්නට ලැබීම සුදුසු නැතැයි නිශ්චය කරන්නාවූද, උක්ත කරුණුවලට අදාළව පවත්වන පරීක්ෂණයේ කිසියම් කොටසක් වන්නාවූද, යමක් වෙතොත් එය මහජනයාහට දන ගැනීමට ඉඩ නොදිය යුතු බව ඔබට මෙයින් අණ කරමි.

තවද ඔබේ පරීක්ෂණ හා විමර්ශණ සඳහා ඔබට සහාය හෝ යම් යම් තොරතුරු අවශ්‍ය වන්නේ යම් යම් රාජ්‍ය නිලධාරීන් හෝ වෙනත් පුද්ගලයන් වෙතින්ද, එවැනි සියළුම රාජ්‍ය නිලධාරීන් හා වෙනත් පුද්ගලයන්, නිසි පරිදි ලබා දිය යුතු හා සැපයිය යුතු එවැනි සියළුම තොරතුරු සැපයිය යුතු බවද මේ සඳහා අවශ්‍ය සියළුම සහාය දිය යුතු බවද මෙයින් අණ කරමි.

එක් දහස් නවසිය හැට පහේ නොවැම්බර් මාසයේ දහත් වැනි දින කොළඹදී ලමම දිවයිනේ මුද්‍රාව තබා දෙන ලදී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

11-961

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල, ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි